අ.පො.ස උසස් පෙළ

# පෙරදිග සංගීතය



## ශ්‍රී ලංකාවේ ගැමි නාට්‍ය

# කෝලම්

- කෝලම් යනු ගැමි නාටක ශෛලියකි.
- පහතරට ශාන්තිකර්ම ආභාෂය මුල් කරගත් ගැමි නාටකයකි.
- රංග භූමිය " තානායම්පොල" ලෙස හඳුන්වයි.
  (මෙය එළිමහනේ මඳක් උස් සම බිමක කවාකාර ලෙස තනා ගනියි.)
- නළුවන් සිය ඇඳුම් මාරු කරන ස්ථානය " ලැඟුම්ගෙය" ලෙස හඳුන්වයි.
- සූදානම් වූ නළුවන් තම වාරය පැමිණෙන තුරු වෙස් අත්තට මුවා වී රැඳී සිටින අතර, වෙස් අත්ත අතරින් රංග භූමියට පිවිසේ.
  (වෙස් අත්ත යනු පසුතලයෙහි ගොරෝක් ගස් දෙකක් සිටුවා සකස් කරන ලද සැරසිල්ලකි.)
- ප්‍රචලිත ප්‍රදේශ ලෙස,
  මිරිස්ස, උඩුපිල, අම්බලන්ගොඩ, හොරණ, බෙන්තර, මාතර යන ප්‍රදේශ දැක්විය හැකිය.

## නාට්‍යමය ලක්ෂණ

- සියළුම චරිත වෙස් මුහුණු පළඳියි. පොතේ ගුරු හෙවත් ගුරුන්නාන්සේ ( සබේ විදානේ ) චරිතය පමණක් වෙස් මුහුණු නොපළඳියි.
- මෙම නාටකය පූර්ව රංගය හා අපර රංගය වශයෙන් කොටස් 02 කි.
- වෙනත් ගැමි නාටකයක නොවන විශේෂ අංගයක් වන පූර්ව රංගය සෑම කෝලම් නාටකයකටම පොදු අංගයකි.
  ( සබේ විදානේ කෝලම ආරම්භ වූ තුනුරුවන් දෙවියන් නමස්කාරය ඉදිරිපත් කරයි.අනතුරුව අණබෙර කෝලම, පොලිස් කෝලම, ආරච්චි කෝලම, පේඩි කෝලම, මුදලි සහ හේවා කෝලම පැමිණේ. අනතුරුව රජු සහ බිසව පැමිණෙති. රජු ඉදිරියෙහි නාග කන්‍යා, ගිරිදේවි, කරපිට කෝලම, නාග රාක්ෂ වැනි නැටුම් සිදු කිරීමෙන් අනතුරුව පූර්ව රංගය නිමා වේ.)

අන්තර්ගතය - එල්.පී.කේ.එච්. පතිරත්න - ගුරු උපදේශක, නක්කවත්ත කොට්ඨාශය, ගිරිඋල්ල.

සැකසුම - ජී.ඩී.සී.එන්. ගමගේ මෙය - මො/මල්ලවත්තාවල ජාතික පාසල, වැල්ලවාය

The National e-learning Portal for The General Education

Copyright © e-thaksalawa.moe.gov.lk

# පෙරදිග සංගීතය

❖ සබේ විදානේ ඇතුළු පූර්ව රංගයේ අතුරු චරිත සෑම නාටකයකටම පොදු චරිත වේ.
❖ සෑම චරිතයක්ම චරිතයට නියමිත පදයක් නටමින් රංගනයට පිවිසෙති.

## සංගීතමය ලක්ෂණ

❖ කෝලම් නාටකයෙහි කාව්‍ය බහුල වන අතර සංවාද අල්ප ලෙස යොදා ගනී.
❖ කවි ගායනා පහතරට ශාන්තිකර්ම ඇසුරෙන් නිර්මාණය වී ඇත.
❖ ගීත ආඝාතාත්මක සහ අනාඝාතාත්මක යන දෙයාකාරයෙන්ම ගායනය කෙරේ.
❖ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය ලෙස පහතරට බෙරය යොදා ගනී.
❖ සරල මෙන්ම ඒකාකාරී නාදරටා මත ගී තනු නිර්මාණය වී ඇත.
❖ චරිත හඳුන්වා දීමේදී කෙරෙන ගායනාවන්ට අත් වැල් ගායකයෝ අතුරු ගායනාවන්ගෙන් සහාය වෙති.
❖ ( වෙස් මුහුණු පැළඳ සිටීම නිසා නළුවන්ගේ කථනය හා ගායනය ප්‍රේක්ෂකයන්ට ඇසීමේ දුර්වලතා පැවතීම නිසා රංගනය අතර කවි ගායනා ද පොතේ ගුරු හා අත්වැල් ගායකයන්ගෙන් සිදුවේ.)
❖ ස්වර ක්ෂේත්‍රය ඉතා පටු වන අතර බොහෝ විට බෙරයේ ශ්‍රැතිය ගායකයාගේ ශ්‍රැතිය වේ.
❖ ස්වර ක්ෂේත්‍රය ඉතා පටු වන අතර ස්වර තුනකට හතරකට සීමා වී ඇත.
❖ පහතරට බෙරය සමඟ තාලම්පට ද තාල වාදනයේ දී යොදා ගනී.



Copyright © e-thaksalawa.moe.gov.lk